# අපූරු වික්‍රමය



H.M.සධනි උත්පලා බණ්ඩාර

කෘතියේ නම:අපූරු වික්‍රමය

කතෘගේ නම: H.M.සධනි උත්පලා බණ්ඩාර

කෘති අයිතිය ඇතුළු විස්තර: පළමු දිගහැරීම

මහමායා බාලිකා විද්‍යාලය,මහනුවර

8E

කෘතිය පළ කරන දින: පළමු වන මුද්‍රණය 2025.02.08

978-624-208-680-4

# පිදුම

මා හට මෙම කෘතිය සකස්කිරීමට

සහය දුන් පවුලේ සැමටත්,

පාසලේ ගුරුවරුන්ටත්,

මෙම කෘතිය ගෞරවයෙන් පුදකරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

නිමල්,සුනිල් සහ අජිත් එකම පාසලේ ඉගෙනුම ලැබූ ගජ මිතුරන් තිදෙනෙක් වූහ.මී බැද්දේගම නම් කුඩා පිටිසර ගමේ උපත ලද මොවුහු කුඩා කාලයේ සිටම හොඳ මිතුරෝ වූහ.සෑම දවසකම පාසල් ගොස් සවස නිමල්ගේ නිවසට එකතු වන්නේ හොඳ හැටි සෙල්ලම් කිරීමටයි.

දවසක් දා සුනිල් සහ අජිත් පාසල ඇරී නිමල්ගේ නිවසට යමින් සිටියේ ය.නිමල්ගේ නිවස තිබුණේ ගමෙන් මදක් ඔබ්බට වන්නට තිබූ කැලෑ රොද අසලය.යන අතරතුරදී නාඳුනන පුද්ගලයන් දෙදෙනෙක් යමක් පිළිබඳව කතා කරමින් පාරේ ගමන් කළහ.සුනිල් මෙය දැක

"අපි අර කොට්ටම්ඹා ගහ ළඟ හැංගෙමු" යැයි කිව්වේ ය.

දෙදෙනාම කොට්ටම්බා ගහට මුවා වූයේ නාඳුනන පුද්ගලයන් දෙදෙනාගේ කතාබහ හොඳින් අසා ගැනීමටයි.

අපි දැන් මේ වැඩේ ගමේ මිනිස්සුන්ට හොරෙන් කරන්නේ කොහොමද?"

උස කෙට්ටු මිනිසා අනෙක් මිනිසාගෙන් ඇසුවේ ය.

"අපි මේ වැඩේ රෑ කලානම් හරි"මහත මිනිසා කිව්වේ ය.

"ඔව් එහෙම කරමු"උස මිනිසා කිව්වේ එය අනුමත කරන්නාක් මෙනි.

මොවුන් දෙදෙනා ඉක්මන් ගමනින් කැළෑවට පියනැඟුවේ තමන්ව වෙනත් ගැමියෙකු දකිති යැයි ඇතිවූ බියෙනි.

"ඒ දෙන්නා ගියා. අපි දැන් නිමල්ගේ ගෙදර යමු"අජිත් පැවසුවේ කල්පනා කරමින් සිටි සුනිල් දෙස බලමින් ය.සුනිල් සහ අජිත් මේ සිද්ධිය නිමල්ට පැවසුවේ ය.

‘එහෙනම් මේ හොරු කැලෑවේ මොනවා හරි දෙයක් අපිට හොරෙන් කරන්නයි යන්නේ ’’නිමල් පැවසුවේ ය.

"අපි අද රෑ කැලෑවට ගිහින් මේක හොයාගන්න ඕන." සුනිල් කිව්වේ ය.

"ඔව්. අද රෑ වෙද්දි අපේ ගෙදරට එන්න"නිමල් කිව්වේ මේ අභිරහස විසඳීමට ඇති ආශාවෙනි.

"හරි අද රෑ එකොළහට එන්නම්"සුනිල් සහ අජිත් කිව්වේ ය.

අපි දැන් යන්නම් කියා මොවුන් දෙදෙනාම ගෙදර යෑමට පිටත් වූයේ අද රෑ

කුමක් සිදුවේදැයි සිතමිනි.අජිත් සහ සුනිල් කාටත් හොරෙන්ම මධ්‍යම රාත්‍රිය වන විට නිමල්ගේ නිවසට පැමිණ නිමල්ට කතා කළේ ය.එවිටම නිමල් පැමිණ අජිත් සහ සුනිල් සමග කැලෑවට යාමට පිය නැගුවේ සිතෙහි චකිතයක් ද සමඟයි.

ඔවුන් කැලෑවේ ටික දුරක් ඇවිද ගිය පසු මිනිසෙක් කතා කරන හඬක් ඇසුණේ ය.ඔවුන් තිදෙනා පඳුරක සැඟවුණි.



"මේ නිදන් වදුලු පොතේ හැටියට මේ ගලේ තමයි නිධානය තියෙන්න ඕනේ" මිනිසා කිව්වේ ය.

"ඒකට තුන් කුලුඳුල් බිල්ලක් ඕනේ කොහොමද හොයාගන්නේ?" මිනිසා ඇසුවේ ය.

"මේ ගමේම ළමයෙක් අරගමු.මම ඒ වැඩේ කරන්නම්"  උස මිනිසා පැවසුවේ ය.

"එහෙනම් අනිද්දා රෑ දොළහට මෙතනදි හම්බවෙමු.මම ළමයෙකුත් අරගෙන එන්නම්."උස මිනිසා කිව්වේ ය.

නිමල්,අජිත් සහ සුනිල් මද වේලාවකින් ඔවුන් ගිය ගියපසු නිවසට යාමට පියනැගුවෝ ය.

සුනිල් කුලුදුල් වන නිසා ඔහු ඉතාමත් බියෙන් සිටිනු දැක, නිමල් "ඔයා මේ දවස්වල ගොඩක් පරිස්සම් වෙන්න සුනිල්"යැයි කිව්වේ ය.

ඊළඟ දවසේ තිදෙනා පාසල් ගොස් සවස් යාමයේ සුනිල් තනියෙන් නිවසට යමින් සිටින අතරතුර නාඳුනන මිනිසෙක් පැමිණ සුනිල්වලින් බලහත්කාරයෙන් කට වසා රැගෙන ගියේ ඔහුට තුන්කුළුදුල් බව දැනගෙනය.එදින සවස නිමගේ නිවසට අජිත් පමණක් පැමිණියේ ය.
මෙය දුටු නිමල් "කෝ සුනිල්?"යැයි අජිත්ගෙන් ඇසුවේ ය.
"එයා අද හවස ඉඳන් ආගිය අතක් නැහැ.ගෙදර අය හොඳටම කලබලවෙලා එයාව හොයනවා යැයි" අජිත් කිව්වේ ය
."එහෙනම් එයාව අර නිදන් හොරු අරගෙන යන්න ඇති.එයා තුන්කුළුදුල් කියලා නිදන් හොරු දැනගන්න ඇති." නිමල් කිව්වේ ඉතාමත් දුකෙනි.
"අපි දැන් මොකද කරන්නේ නිමල්?" අජිත් ඇසුවේ ය.

"අපි අදත් කැලෑවට ගිහින් සුනිල්ව හොයාගන්න බලමු. ඔයා අද රෑ අපේ ගෙදර එන්න." නිමල් කියූ පසු අජිත් ඒ අනුමත කර "මම එන්නම්" යැයි කිව්වේ ය. .

එදින රෑ අජිත් සහ නිමල් කැලෑවට යමින් සිටියේ ය.ඔවුන් නිධානය තිබෙන තැනට ළඟා වුණු පසු සුනිල් නොසිට වෙනත් නාඳුනන මිනිසුන් කිහිපදෙනෙකු විසින් එම ගල අසල වල්පැළ ගලවා පිරිසිදු කරමින් සිටියේ ය.



"මම තුන්කුලුදුල් පිරිමි ළමයෙක් හොයාගත්තා"මිනිසා කිව්වේ ය.

"එහෙනං මේ වැඩේට ඔක්කොම දේවල් හරි." එක් මිනිසෙක් කිව්වේ ය.

ඔව් ඔව් ඒ නිධානය ගොඩගත්තායින් පස්සේ අපි පෝසත්තු තමයි.මම මීට කලින් හොයාගත්තු නිධානත් වැරදිලා නෑ."උස මිනිසා ඉතාමත් සතුටින් කිව්වේ ය.

ඔවුන් ටික වේලාවකින් යන්නට ගියේ ය.

"මේ උස මිනිහා කට්ටඩියෙක් වෙන්න ඇති දැන් මොකද කරන්නේ? පොලිසියටවත් කියමුද?"නිමල් අජිත්ගෙන් ඇසුවේ ය.

"ඔව් එහෙම වෙන්න ඇති. අපි මේ ගැන පොලිසියට කියලා හෙට රෑ ඇවිත් මේ නිදන් හොරු අතටම අල්ලාගෙන සුනිල්වත් බේරගමු" අජිත් කිව්වේ ය.

"ඒක හොඳයි, අපි දැන් ගෙදර යමු.අර නිදන් හොරු ආයෙත් ආවොත් අපි අතටම අහුවේවි"කිව්ව නිමල් අජිත් සමඟ නිවෙස් වලට ගියෝ ය.

පසු දින මොවුන් දෙදෙනා පාසල් ගියත් හිතෙහි සුනිල් නැති දුකත්,අද රෑ සිදු කරන්නට යන මේ ත්‍රාසජනක ක්‍රියාවත් සිතෙහි ගලේ කෙටූ අකුරක් මෙන් තැන්පත් වී ඇත.

එදින පාසල් ගොස් නිවසට පැමිණි නිමල් සහ අජිත් මේ බව නිමල්ගේ තාත්තාට ද පවසා ඔහු සමග පොලිසියට ගියේ ය.ඔවුහු මේ බව පොලිස් ස්ථානාධිපති තුමාටද දන්වා පොලිස් භටයින් කිහිපදෙනෙක් අද රාත්‍රියේ ඔවුන් සමග කැලෑවට ගොස් නිදන් හොරු අල්ලා ගැනීමට උදව්වීමට එවන ලෙස ඉල්ලීමේදී පොලිස් ස්ථානාධිපතිතුමා අජිත්,නිමල් හා සුනිල්ව අගය කර ඔහුත් සමග තවත් පොලිස් භටයින් කිහිප දෙනෙකු එවන බවට පැවසුවේ ය.

එදින රෑ එකොළහට පමණ අජිත් සහ නිමල් පොලිස් භටයින් ද සමග කැලෑවට යන විට නිදන් හොරු නිධානය ගැනීමට සියලු දේ සකසා තිබුණේ ය.ටික වේලාවකින් තොවිලය ආරම්භ විය.සුනිල් ද රැගෙන තවත් මිනිසෙකු එතනට පැමිණියේ ය.එවිටම ක්‍රියාත්මක වූ අජිත්, නිමල් සහ පොලිස් බටයින් ඔවුන්ව අල්ලා ගත්හ.



අජිත් සහ නිමල් සුනිල්ව ගැටගසා තිබූ ලණුව ගලවා ඔහු මුදවා ගත්තේ ය.ඒ අතරම පොලිස් හටයින් නිදන් හොරු පස්දෙනාව සිර භාරයට ගත්හ.ඒ අතර ගමෙහි සිටි ගැමියෙක් සිටින බව දුටු ඔවුහු පුදුමයට පත් වූහ.ඔහු විසින් සුනිල් තුන්කුලුදුල් බව සොයාගෙන ඔහුව පැහැර ගැනීමට නිදන් හොරුට උදව් කර තිබෙන බව පසුව දැනගන්නටට ලැබිණි.

මේ වනවිට අජිත්,නිමල් සහ සුනිල් පිළිබඳව විවිධ පුවත්පත්වල  පළ වී තිබුණේ "නිදන් හොරු අල්ලා ගත් සුමිතුරන් තිදෙනා" යන සිරස්තලයෙනි.

ඔවුන් සිදුකළ මේ වීර ක්‍රියාව අගයමින් රජයෙන් ඔවුන් තිදෙනාට විශේෂ ත්‍යාග මුදල් හිමිවිය. මේ තිදෙනා ඊළඟ දවසේ සුපුරුදු පරිදි පාසල් ගියෝ ය.

එහිදී විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලය ඔවුන්ව අගය කළේ ය. එසේ ටික කලක් ගතවූ පසු අජිත්,සුනිල් හා නිමල්  පුස්තකාලයට ගිය විට අර නිදන් හොරුගෙන් කෙනෙක් දක්නට ලැබුණේ ය.එම හොරා මොවුන්ව

දැක්ක පසු දුවන්නට පටන් ගත්තේ ය.මොවුන් ඔහු දෙස පුදුමයෙන් බලා සිටියද ඔහු ටික වේලාවකින් කඩ වීදිය අසලින් අතුරුදහන් විය.

මඳ වේලාවකට පසු අජිත් පුවත්පතක් අතට ගෙන කියවන්නට විය.එහි තිබූ දැන්වීමක් දැක ඔහු එය අනෙක් දෙදෙනාට පෙන්වීය.එහි කියවූයේ ඔවුන් අල්ලා ගත් නිදන් හොරු පස්දෙනාගෙන් එක් අයෙකු හිරෙන් පැන ගොස් ඇති බවයි.ඔවුහු ඉතාමත් බියට පත් වූයේ හිරෙන් පැන ගොස් ඇත්තේ උස කට්ටඩියා වන බව දැන ගත් නිසයි. ඔහු දරුණු මිනිසෙකි. මෙයින් ඔවුන්ගේ සිත් කැලඹීමට පත් වීමට ගත වූයේ ක්ෂණයකි.

පුස්තකාලාධිපතිතුමාගෙන් දැනගැනීමට ලැබුණේ ඔහු සෙව්වේ නිදන් වදුළු පිළිබඳ පොත් බවයි.එයින් ඔහු තවමත් නිදන් හැරීම පිළිබඳව අතහැර නොමැති බව පැහැදිලි වේ.

"අපිට දැන් ගොඩක් පරිස්සමින් ඉන්න වෙනවා.තනියෙන් කොහෙවත් යන්න එපා.දැන් ඒ කට්ටඩියා අපි ගැන විමසිල්ලෙන් තමයි ඉන්නේ"නිමල් කිව්වේ ය.

පසු කලෙක එම කට්ටඩියා විසින් නැවත වතාවක් නිධානයක් හැරීමට ගොස් ගම්වැසියන් විසින් පොලිසියට අල්ලා දී දීර්ඝ කාලීන සිර දඬුවමකට නියම වී ඇති බව පුවත්පත්වලින් දැනගන්නට ලැබිණි.

"දැන් නම් බයවෙන්න දෙයක් නැහැ"අජිත් කිව්වේ සිනා මුසු මුහුණින් අනිත් දෙදෙනා දෙස බලමිනි.

නමුත් වසර කිහිපයක් ගෙවුණු පසු ඔවුන්ට පුවත්පත් මඟින් දැනගන්නට ලැබුණේ අර නිධන් හොරු නැවතත් හිරෙන් නිදහස් වී ඇති බවයි.

අජිත්,නිමල් සහ සුනිල් මේ පිළිබඳ වැඩි තැකීමක් නොකර චාරිකාවක් සඳහා පොළොන්නරුවට යැමට සූදානම් වුණි.එදින උදෑසනම නිවසින් පිටත්වුණු ඔවුහු පොළොන්නරුවට ළඟා වීමේ දී දහවල් 11.00 පමණ වුණි.ඔවුහු බොහෝ ස්ථාන නැරඹීමට ගියහ.

එදින ඔවුහු ගල් විහාරයට ළඟා වීමේ දී සවස 3.00 පමණ වී තිබුණු අතර ඔවුහු ගල් විහාරය වන්දනා කර ඒ අවට නැරඹීමට ගියහ. ඒ පෙදෙස ඉපැරණි ගල් කණු ආදි බොහෝ නටබුන් සහිත විය.ඔවුහු ඇවිදිමින් සිටින දුර සිටින

මිනිසුන් කිහිපදෙනෙක් විසින් ගල්කණුවක් තිබූ ස්ථානයක් පිළිබඳ සෝදිසි කරමින් සිටියහ.



ඒ ගැන සැකයක් නොහිතූ ඔවුහු ඒ පෙදෙස නරඹා ඔවුන්ගේ නවාතැන්පොළට ගියෝ ය.

"අර අපි ගල් විහාරයේ දී දැක්කේ පුරාවිද්‍යාඥයෝ වෙන්න ඇති නේද?"නිමල් අනෙක් දෙදෙනාගෙන් ඇසුවේ ය.

"ඔව් එහෙම වෙන්න ඇති."සුනිල් කිව්වේ ය.

ඊළඟ දවසේ ඔවුහු කඩයකින් පුවත්පතක් මිලට ගෙන එය කියවන්නට විය.එහි මුල්ම සිරස්තලය වූයේ ගල් විහාරයට යාබදව තිබූ නටබුන් සහිත ස්ථානයේ ගල්කණුවක් අතුරුදන් වී ඇති බවයි.මෙය කියවූ ඔවුන් පුදුමයට පත්විය.

"මට නම් අපි අර ඊයේ දැක්ක අර ගල්කණුව ළඟ හිටපු මිනිස්සු ගැන සැක හිතෙනවා. "නිමල් කිව්වේ ය.

"ඔව් ඒක නම් ඇත්ත."සුනිල් කිව්වේ ය.

"අපි අද එතන බලන්න ගියා නම් හොඳයි."අජිත් කිව්වේ ය.

" අපි අද රෑ එතනට ගිහින් මේ නිධන් හොරු එනවද කියලා බලමු."නිමල් කිව්වේ ය.

එදින මධ්‍යම රාත්‍රිය වන විට ඔවුහු තිදෙනා ගල් විහාරයට ගොස් සැඟවී සිටියෝ ය.මඳ වේලාවකින් මිනිසුන් කිහිපදෙනෙක් පැමිණ ගල කැණීමට පටන්ගත්හ.

"ඒ අර අපි කලින් පොලීසියට අල්ලල දුන්නු මිනිස්සු. අර කට්ටඩියාත් ඉන්නේ."අජිත් පැවසූ අතර "අපි දැන් මොකද කරන්නේ?"යැයි ඇසුවේ ය.

"මෙතන නිධානයක් ඇති නේද?අපිට දැන් පොලීසියට යන්නත් බෑ.ගොඩක් දුරයි.අපි මේ තුන්දෙනාව අල්ලගමු.ඊට පස්සේ උදෙන්ම පොලීසියව එක්කගෙන එමු."නිමල් කිව්වේ ය.

"අපි කොහොමද අල්ලගන්නේ?ආ..මෙතන ලණුවක් තියෙනවා.එහෙනම් තුන්දෙනාම අර ගහට තියලා ලණුවෙන් බඳිමු.''අජිත් කිව්වේ ය.

"එහෙම කරමු."යැයි කියූ නිමල් අනිත් දෙදෙනාත් සමඟ එකතු වී ක්ෂණිකව නිධන් හොරු තිදෙනාව අල්ලාගෙන ලණුවෙන් ගහේ බැන්දෝ ය.

"අපි දැන් පොලීසියව එක්කගෙන එමු"යැයි කියූ සුනිල් නිමල් සමඟ පිටත්වූයේ අජිත්ව හොරු තිදෙනා බලාගැනීමට තබමිනි.

ටික වේලාවකින් පොලීසියත් සමඟ එතැනට පැමිණි සුනිල් සහ නිමල් හොරු තිදෙනාව පොලීසියට බාරදුන් අතර පොලීසිය ඔවුන්ව අත්අඩංගුවට ගත්තෝ ය.

"ඔන්න අපි තවත් වීරක්‍රියාවක් කළා.අපි දැන් පොළොන්නරුවේ ඇවිදින්න යමු."නිමල් පැවසුවේ ය.

දැන් ඔවුන් බොහෝ සේ ප්‍රසිද්ධ වී තිබු අතර එසේ වූයේ ඔවුන් තිදෙනා නිධන් හොරු අල්ලා පොලීසියට බාරදුන් වීරයන් ලෙස පුවත්පත්වල හා රූපවාහිනීවල ප්‍රසිද්ධ වී තිබූ හෙයිනි.



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

978-624-208-680-4